# ඇබෑර්තු නිවේදනය

## ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය

**2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ආරම්භ කර ඇත. පුද්ගලික දත්ත පාලනය හා සැකසීම නියාමනය කිරීම සහ එම ක්‍රියාවලීන්හි දී පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය පිළිබඳ අයිතීන් ආරක්ෂා කිරීමේ අරමුණින් පිහිටුවා ඇති මෙම අධිකාරිය, සියලුම රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, මෙම පනතේ දක්වා ඇති නෛතික බැඳීම්වලට අනුකූලව කටයුතු කරන බව සහතික කරනු ඇත. මෙමගින් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකයේ වර්ධනයට සහ නවෝත්පාදනයට අනුබල දීම මෙන්ම, ඩිජිටල් ගනුදෙනු සහ සන්නිවේදනයන් ආරක්ෂිත සහ විශ්වාසදායක බව සහතික කිරීම ද අරමුණු කෙරේ. මෙම අධිකාරියේ කාර්යභාරය ඉටුකිරීමට පහත සඳහන් රැකියා අබෑර්තු සම්පූර්ණ කිරීම සඳහා නිපුණතා පූර්ණ වෘත්තිකයන් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.**

### 1. අධ්‍යක්ෂ ජනරාල් තනතුර

**කාර්ය විස්තරය**

අ. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ඉහළම මට්ටමේ විධායක නිලධාරියා වේ. 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 36(4) වන වගන්තියට අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය අධීක්ෂණයට හා පාලනයට යටත්ව, අධිකාරියේ කටයුතු හා ගනුදෙනු මෙහෙයවීම, එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටුකිරීම සහ අධිකාරියේ නිලධරයන් හා සේවා නියුක්තයන් පරිපාලනය කිරීම හා පාලනය කිරීම සිදුකරනු ලැබිය යුතුය.

ආ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවීම යටතේ අධිකාරියේ පරිපාලනය, මූල්‍ය හා මෙහෙයුම් පාලනය සඳහා සමස්ත වගකීම දැරීම.

ඇ. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරුන්, අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් අංශ ප්‍රධානීන්ගෙන් සමන්විත අධිකාරියේ විධායක කමිටුවේ සභාපතිත්වය දැරීම.

ඈ. පෞද්ගලික දත්ත ආරක්ෂණය හා දත්තවල පෞද්ගලිකත්වය සම්බන්ධ නව ප්‍රවණතා හඳුනා ගැනීම ඇතුළු සැලසුම් හා උපායමාර්ග සකස් කිරීම සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.

ඉ. පෞද්ගලික දත්ත ආරක්ෂණය හා සම්බන්ධ සංවර්ධන ව්‍යාපෘති සඳහා සැලසුම් සකස් කිරීම සහ හඳුනාගත් ඉලක්කගත කණ්ඩායම් අතර දැනුවත්භාවය වැඩිකිරීම සඳහා ක්‍රියාකාරකම් මෙහෙයවීම.

ඊ. අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන් හි දී ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලනු ලැබීම පිණිස නිල වාර්තා / ලේඛන / අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සකස් කිරීම.

උ. හිතකර ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා, අභ්‍යන්තර සම්බන්ධීකරණය සඳහා සහ කණ්ඩායම් ලෙස වැඩ කිරීම සඳහා නායකත්වය සැපයීම.

ඌ. මණ්ඩලයේ සහ අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව දත්ත ආරක්ෂණය සම්බන්ධ කාරණා සඳහා ආණ්ඩුව සහ දත්ත ආරක්ෂණ අධිකාරිය ජාත්‍යන්තර වශයෙන් නියෝජනය කිරීම.

එ. අධිකාරියේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණය කිරීම.

ඒ. සියලුම අංශ විසින් හඳුනාගත් සහ සිදු කරනු ලබන පර්යේෂණ හා සංවර්ධන වැඩ කටයුතු අධීක්ෂණය කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අයදුම්කරු පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(අ) නීතිය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්;

සහ

නීතිය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව,පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව පිළිබඳව වන හෝ තනතුරට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Master's) හෝ ගණකාධිකරණය, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය හෝ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත / අධි සාමාජිකත්වය ලබා තිබීම;

සමග

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ වෙළෙඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර පහක (05) පළපුරුද්ද සමග විය යුතු අවම වශයෙන් වසර පහළොවක (15) කළමනාකරණ පළපුරුද්ද සතු බව සනාථ කළ හැකි වාර්තාවක්;

හෝ

(ආ) නීතිය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත්යම් උපාධියක්;

සහ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් ආචාර්ය උපාධියක්,

සමග

ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පූර්ණවශයෙන් රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ වෙළෙඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද සතු වන බව සනාථ කළ හැකි වාර්තාවක්.

**වයස :** වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

### 2. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ තනතුර - නියාමන උපායමාර්ග

**කාර්ය විස්තරය**

අ. 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යටතේ නිකුත් කළ යුතු රීති, මාර්ගෝපදේශ සහ නියම සකස් කිරීම.

ආ. පනතේ විධිවිධාන අනුව අමාත්‍යවරයා විසින් නිකුත් කළ යුතු නියෝග කෙටුම්පත් කිරීම.

ඇ. වෙනත් රටවල අදාළ ලිඛිත නීතිය සහ බලාත්මක කිරීමේ යාන්ත්‍රණ අධ්‍යයනය කිරීමෙන් පසුව දේශ සීමා හරහා පෞද්ගලික දත්ත සංචලනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් තීරණ අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

ඈ. දත්ත පාලකවරයන්ට සහ දත්ත සකසන්නන්ට සාමාන්‍ය විධාන සහ උපදෙස් නිකුත් කිරීම.

ඉ. පනතට අනුකූලව දත්ත ආරක්ෂණය, දත්ත ගබඩා කිරීම, දත්ත සැකසීම සහ වෙනත් අදාළ කාරණා සම්බන්ධයෙන් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම.

ඊ. සහතිකකිරීම් සහ සහතික කිරීමේ ආයතන පිළිගැනීම සඳහා නිර්ණායක ක්‍රමානුකූලව සකස් කිරීම.

උ. අන්තර්ජාතික සම්මුතීන් යටතේ දත්ත ආරක්ෂණ වගකීම්වලට දේශීයව ඵලදායී ලෙස අනුකූල වන බවට සහතික කිරීම.

ඌ. දත්ත ආරක්ෂණයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

එ. අනන්‍යතා කළමනාකරණය සහ ඊට අදාළ සේවා නියාමනය කිරීමේ අරමුණින් බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරයන්ට සහ දත්ත සකසන්නන්ට බලපත්‍ර නිකුත් කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අයදුම්කරු පහත සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(අ) නීතිය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය පිළිබඳ ශ්‍රීලංකාවේ විශ්වවිද්‍යාලප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්.

සහ

නීතිය, තොරතුරු තාක්ෂණය,පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණ පිළිබඳව වන හෝ තනතුරට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Master's) හෝ තොරතුරු තාක්ෂණය හෝ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයක පිළිගත්වෘත්තීය ආයතනයක ආශ්‍රිත / අධි සාමාජිකත්වය දැරීම හෝ නීතිඥවරයකු වීම.

සමග

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව හෝ පිළිගත්වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව හෝ නීතිඥයකු ලෙස දිවුරුම් දීමෙන් පසුව රාජ්‍ය හෝ පෞද්ගලික අංශය තුළ සාර්ථක ප්‍රතිපත්තිමය නායකත්වයක් ලබා දීම පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය තනතුරක වසර තුනක (03) පළපුරුද්ද ද සමග විය යුතු අවම වශයෙන් වූ වසර දෙළහක (12) කළමනාකරණ පළපුරුද්ද සහිත විය යුතු අතර, නියාමන පරිසරයක් තුළ උපායමාර්ගික ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිළිබඳ පළපුරුද්දක් ඇති බවට සාක්ෂි සහිත වීම වඩාත් සුදුසු වේ.

හෝ

(ආ) නීතිය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය පිළිබඳ ශ්‍රීලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්.

සහ

නීතිය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය හෝ තනතුරට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක්.

සමග

ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය හෝ පෞද්ගලික අංශය තුළ සාර්ථක ලෙස ප්‍රතිපත්තිමය නායකත්වය ලබා දීම පිළිබඳ අවම වශයෙන් වසර හතරක (04) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද සහිත විය යුතු අතර, නියාමන පරිසරයක් තුළ උපායමාර්ගික ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිළිබඳ පළපුරුද්දක් ඇතිබවට සාක්ෂි සහිත වීම වඩාත් සුදුසු වේ.

**වයස :** වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

### 3. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ තනතුර - වෙළෙඳපොළ අධීක්ෂණ සහ ධාරිතා සංවර්ධන

**කාර්ය විස්තරය**

අ. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අෂ්ථිත්වවල නම් කරන ලද දත්ත ආරක්ෂණ නිලධාරීන් සමග සම්බන්ධ වීම සහ අවශ්‍ය අවස්ථාවල දී උපදෙස් ලබා දීම.

ආ. සියලුම දත්ත සැකසීමේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම හා පරීක්ෂා කිරීම සහ අවශ්‍ය පරිදි පාලකවරයන්ට හා දත්ත සකසන්නන්ට නිශ්චිත විධාන නිකුත් කිරීම.

ඇ. පෞද්ගලික දත්ත කඩකිරීම පිළිබඳ නිවේදන භාර ගැනීම, ඒවා සමාලෝචනය කිරීම සහ සුදුසු පරිදි අවශ්‍ය පියවර ගැනීම.

ඈ. පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීම භාර ගැනීම, ඒවා සමාලෝචනය කිරීම සහ අවදානම අවම කිරීම සඳහා අතිරේක පියවර ගැනීමට ලිඛිත උපදෙස් නිකුත් කිරීම.

ඉ. පාලකවරයන් හා දත්ත සකසන්නන් විසින් සිදු කරනු ලබන දත්ත සකස්කිරීමේ කටයුතු පිළිබඳව කාලානුරූපී ඇගයීම් සිදු කිරීම.

ඊ. පාලකවරුන්ට හා දත්ත සකසන්නන්ට ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යහපත් පරිචයන් මත පදනම්ව පුහුණුවීම සිදුකිරීම හෝ ඒ සඳහා පහසුකම් සැලසීම.

උ. සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාකච්ඡාමුළු සංවිධානය කිරීම හා පැවැත්වීම ඇතුළුව දත්ත ආරක්ෂණයට අදාළ ඉගෙනුම් හා අධ්‍යාපනික කටයුතු ප්‍රවර්ධනය කිරීම.

ඌ. විදේශීය දත්ත සැකසුම් අධිකාරීන් සහ ජාත්‍යන්තර හෝ අන්තර් - රාජ්‍ය සංවිධාන ඇතුළු වෙනත් සංවිධාන සමග දත්ත ආරක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සහයෝගීතාව හා හුවමාරුව කළමනාකරණය කිරීම.

එ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වාර්ෂික සැලැස්මකට අනුකූලව, බහුවිධ පාර්ශ්වකරුවන් ඉලක්ක කරගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අයදුම්කරු පහත සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(අ) තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්තවිද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්.

සහ

තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව පිළිබඳව වන හෝ තනතුරට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Master's) හෝ තොරතුරු තාක්ෂණය, ගණකාධිකරණය, විගණනය හෝ අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත / අධි සාමාජිකත්වය දැරීම හෝ නීතිඥයකු වීම.

සමග

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව හෝ නීතිඥයකු ලෙස දිවුරුම් දීමෙන් පසුව රාජ්‍ය හෝ පෞද්ගලික අංශය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර තුනක (03) පළපුරුද්ද සමග විය යුතු අවම වශයෙන් වසර දෙළහක (12) කළමනාකරණ පළපුරුද්ද සහිත විය යුතු අතර, නියාමන පරිසරයක් තුළ අධීක්ෂණ පරීක්ෂාව හා ධාරිතා සංවර්ධනය පිළිබඳ පළපුරුද්දක් ඇති බවට සාක්ෂි සහිත වීම වඩාත් සුදුසු වේ.

හෝ

(ආ) තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්.

සහ

තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, ආර්ථික විද්‍යාව හෝ තනතුරට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක්.

සමග

ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය හෝ පෞද්ගලික අංශය තුළ අවම වශයෙන් වසර හතරක (04) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පළපුරුද්ද සහිත විය යුතු අතර, නියාමන පරිසරයක් තුළ අධීක්ෂණ පරීක්ෂාව සහ ධාරිතාව ගොඩනැගීම පිළිබඳව පළපුරුද්දක් ඇති බවට සාක්ෂි සහිත වීම වඩාත් සුදුසු වේ.

**වයස :** වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

### 4. අධ්‍යක්ෂ තනතුර - මානව සම්පත් සහ පරිපාලන

**කාර්ය විස්තරය**

අ. බඳවා ගැනීම, තනතුරු පැවරීම, පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ, කාර්යසාධන කළමනාකරණය සහ කාර්යමණ්ඩල සම්බන්ධතා ඇතුළු සියලුම මානව සම්පත් කළමනාකරණ කාර්ය කළමනාකරණය කිරීම.

ආ. කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතර පවතින කුසලතා පරතර තක්සේරු කිරීම සහ ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා සුදුසු පුහුණු අවස්ථා පිළියෙළ කිරීම.

ඇ. කාර්යාල පරිශ්‍රයේ පරිපාලනය සඳහා වගකීම දැරීම සහ අධිකාරියේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා සියලුම සැපයුම් සංවිධාන කටයුතු කළමනාකරණය කිරීම.

ඈ. අධිකාරිය වෙනුවෙන් සියලුම ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය කිරීම.

ඉ. අධිකාරිය බාහිර සේවා සපයන්නන් සියලුදෙනා කළමනාකරණය කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අයදුම්කරු පහත සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(අ) මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්.

සහ

මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍ය පිළිබඳව වන හෝ තනතුරට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Master's) හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක වරලත් සාමාජිකත්වය.

සමග

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ වෙළෙඳ ආයතනයක මානව සම්පත් සහ පරිපාලනය පිළිබඳ අවම වශයෙන් වසර දහයක (10) කළමනාකරණ පළපුරුද්ද පිළිබඳ සනාථ කළ හැකි වාර්තාවක්.

හෝ

(ආ) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අධි සාමාජිකත්වය.

සමග

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ වෙළෙඳ ආයතනයක මානව සම්පත් සහ පරිපාලනය පිළිබඳ අවම වශයෙන් වසර දහයක (10) කළමනාකරණ පළපුරුද්ද පිළිබඳ සනාථ කළ හැකි වාර්තාවක්.

**වයස :** වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

### 5. අධ්‍යක්ෂ තනතුර - මූල්‍ය

**කාර්ය විස්තරය**

අ. නිසි අයවැය පාලනයක් ක්‍රියාත්මක කරමින් අධිකාරියේ ආදායම් හා වියදම් කළමනාකරණය කිරීම.

ආ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් පවත්වාගෙන යාම.

ඇ. අවසාන ගිණුම් පිළියෙල කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික වාර්තාව සම්පාදනය කිරීම.

ඈ. මණ්ඩලය සඳහා මාසික කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා පිළියෙල කිරීම.

ඉ. අවශ්‍ය පරිදි අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කිරීම.

ඊ. අධිකාරියේ ආයෝජන සහ වෙනත් වත්කම් කළමනාකරණය කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අයදුම්කරු පහත සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(අ) ගිණුම්කරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය පිළිබඳ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්.

සහ

ගණකාධිකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සමග

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අවුරුදු දහයක (10) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

හෝ

(ආ) ගණකාධිකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අධිසාමාජිකත්වය.

සමග

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අවුරුදු දහයක (10) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**වයස :** වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

### 6. අධ්‍යක්ෂ තනතුර - නීතිය සහ බලාත්මක කිරීම

**කාර්ය විස්තරය**

**අධ්‍යක්ෂ - නීති සහ බලාත්මක කිරීම්**

අ. අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අධිකාරියේ වෙනත් සියලුම අංශවලට නීති සහාය සහ උපදෙස් ලබා දීම.

ආ. අධිකාරිය වෙනුවෙන් සියලුම නෛතික ලේඛන සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ඇ. අධිකාරියට අදාළ සියලුම නඩු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ඈ. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වෙනත් අදාළ ආයතන සමග ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම සඳහා පහසුකම් සැලසීම.

ඉ. නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ වෙනත් බාහිර පාර්ශ්වයන් සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අයදුම්කරු පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුය.

නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් සහිත නීතිඥයකු වීම.

සමග

නීතිඥවරයකු ලෙස දිවුරුම් දීමෙන් පසුව, රාජ්‍ය හෝ පෞද්ගලික අංශය තුළ කළමනාකරණ තනතුරක වසර පහක (05) පළපුරුද්ද ද සමග විය යුතු අවම වශයෙන් වූ වසර දහයක (10) ආයතනික / විෂය පළපුරුද්ද සහිත විය යුතු අතර, නියාමන පරිසරයක් තුළ නීති සහ බලාත්මක කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිළිබඳ පළපුරුද්දක් ඇති බවට සාක්ෂි සහිත වීම වඩාත් සුදුසු වේ.

**වයස :** වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

### 7. අධ්‍යක්ෂ තනතුර - ආරවුල් බේරුම්කරන

**කාර්ය විස්තරය**

අ. 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධානවලට අනුකූලව දත්ත දායකයන්ගෙන් සහ වෙනත් යම් අගතියට පත් පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි භාර ගැනීම සහ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම.

ආ. යම් තැනැත්තන්ට දත්ත ආරක්ෂණ අධිකාරිය ඉදිරියේ පෙනී සිටින ලෙසට නියම කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී දිවුරුමක් යටතේ තැනැත්තන් විභාග කිරීම.

ඇ. යම් පාලකවරයකුගේ හෝ දත්ත සකසන්නකුගේ පරිශ්‍රයට ඇතුළු වීම, වාර්තා පරීක්ෂා කිරීම හෝ අත් පත් කර ගැනීම සහ විමර්ශන පැවැත්වීම.

ඈ. 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූලව විධාන නිකුත් කිරීම සහ දඩ මුදල්, දණ්ඩන සහ ගත යුතු වෙනත් සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අයදුම්කරු පහත සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(අ) නීතිය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්.

සහ

තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව පිළිබඳව වන හෝ තනතුරට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Master's) හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය.

සමග

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අවුරුදු දහයක (10) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

හෝ

(ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අධි සාමාජිකත්වය.

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අවුරුදු දහයක (10) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

හෝ

(ඇ) තනතුරට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Master's) සහිත නීතිඥයකු වීම.

සමග

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අවුරුදු දහයක (10) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**වයස :** වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

## 8. අභ්‍යන්තර විගණක

### කාර්ය විස්තරය

අ. අවදානම තක්සේරු කිරීම් මත පදනම්ව සවිස්තරාත්මක විගණන සැලසුම් ක්‍රමානුකූලව සකස්කර ක්‍රියාත්මක කිරීම.

ආ. අභ්‍යන්තර පාලනයන්හි, මූල්‍ය පද්ධතිවල සහ නියෝගවලට අනුකූලවීමේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම සහ අභ්‍යන්තර විගණන පැවැත්වීම.

ඇ. මූල්‍ය තොරතුරුවල නිරවද්‍යතාව සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා ක්‍රියාවලීන් පරීක්ෂා කිරීම සහ ඇගයීම් ඇතුළු විගණක කාර්යපටිපාටිය ක්‍රියාත්මක කිරීම.

ඈ. ආයතනය තුළ ඇති විය හැකි අවදානම් සහ අනාරක්ෂිත තත්ත්වයන් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම.

ඉ. විෂමතා, අක්‍රමිකතා ආදිය හඳුනා ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාළ ලේඛන විශ්ලේෂණය කිරීම.

ඊ. මූල්‍ය පාලන සහ වාර්තා කිරීමේ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ සැපයීම.

උ. තීරණ, නිර්දේශ සහ ක්‍රියාකාරී සැලසුම් සාරාංශ කරමින් විස්තරාත්මක සහ නිරවද්‍ය විගණන වාර්තා පිළියෙල කිරීම.

ඌ. සැලකිලිමත් වියයුතු ක්ෂේත්‍ර සහ වැඩිදියුණු කිරීමේ අවස්ථා ඉස්මතු කරමින් කළමනාකාරිත්වයට විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීම.

### සුදුසුකම් සහ පළපුරුද්ද

අයදුම්කරු පහත සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(අ) ගිණුම්කරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය,වාණිජ්‍ය පිළිබඳ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ වෙනත් යම් උපාධියක්

**සහ**

ගණකාධිකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සමග**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අවුරුදු දහයක (10) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**හෝ**

(ආ) ගණකාධිකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අධි සාමාජිකත්වය.

**සමග**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අවුරුදු දහයක (10) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**වයස :** වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

## 9. සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ

### කාර්ය විස්තරය

අ. ආයතනයේ ඩිජිටල්කරණ උපායමාර්ග වර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට දායක වීම ආයතනයේ තාක්ෂණික යටිතල පහසුකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම අධීක්ෂණය කිරීම.

ආ. අධිකාරියේ සේවා - දිගාතත ඉලක්ක සමග තාක්‍ෂණික මූලපිරීම් ගලපා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සමග සහයෝගීත්වයෙන් කටයුතු කිරීම.

ඇ. ජාල, සේවා පරිගණක සහ වෙනත් තොරතුරු තාක්ෂණ පද්ධතිවල උපයෝජ්‍යතාවය, ආරක්ෂාව සහ කාර්යසාධනය සහතික කිරීම.

ඈ. ඒ හා සම්බන්ධ ප්‍රසම්පාදන හා ගිවිසුම් කළමනාකරණය සඳහා සහාය වීම.

ඉ. පරිශීලකයන්ගේ ගැටලු කාලීනව සහ ඵලදායී ලෙස විසඳීම සහතික කරමින් තොරතුරු තාක්ෂණ උපකාරක සේවාව අධීක්ෂණය කිරීම.

ඊ. කාර්ය මණ්ඩලයේ තාක්ෂණික සාක්ෂරතාව වැඩි දියුණු කිරීම සඳහා තොරුතරු තාක්ෂණ පුහුණු වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

### සුදුසුකම් සහ පළපුරුද්ද

අයදුම්කරු පහත සුදුසුකම් ලබා තිබිය යුතුය.

තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණ පිළිබඳ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ උපාධියක්.

**සහ**

තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, දත්ත සැකසුම් කළමනාකරණය පිළිබඳව වන හෝ තනතුරට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Master's) හෝ තොරතුරු තාක්ෂණය හෝ අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය.

**සමග**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර හයක (06) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**වයස :** වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

### වේතන සහ ප්‍රතිලාභ :

අ. සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවානියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා හිමිකම් සහිතව ආරම්භයේදී වසර තුනක (03) කාලසීමාවක් සඳහා වන ස්ථාවර කාලීන ගිවිසුමකි.

ආ. අධිකාරියේ ස්ථාවර කාලීන සේවකයින් වෙත ලබාදෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ සමග ආකර්ශණීය වේතන පැකේජයක්.

### අනෙකුත් අවශ්‍යතා

අ. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ. තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට සහ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතුය.

ඇ. විශිෂ්ට වූ මනා චරිතයකින් යුක්ත විය යුතුය.

ඈ. ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් විදේශීය ආයතන සමග අන්තර් ක්‍රියාකිරීම වෘත්තීය ශ්‍රේණිය සඳහා වන රැකියා අවශ්‍යතාවයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා නිපුණත්වයක් තිබිය යුතුය.

ඉ. ඩිජිටල් ආර්ථිකය සහ සමාජ මාධ්‍ය සම්බන්ධ දැනුම හා ඒ පිළිබඳ වන පරිචය වාසි සහගත වනු ඇත.

## පොදු කොන්දේසි

**වයස :** රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සම්පූර්ණයෙන් රජයට අයත් සමාගම් හි සේවයේ නියුතු අයදුම්කරුවන්ට වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :** සම්මුඛ පරීක්ෂණ එකක් හෝ වැඩි ගණනක් මත පදනම්ව සුදුසු අයදුම්කරු තෝරාගනු ලැබේ.

පත්වීම් සිදු කරනු ලබන්නේ කුසලතා අනුපිළිවෙල අනුව පමණි.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :** 2025 නොවැම්බර් 17

## අනුයුක්ත කිරීම :

මෙම තනතුරට අනුයුක්ත වීමට අපේක්ෂා කරන රාජ්‍ය සේවයේ සුදුසුකම් සහිත යම් නිලධරයකු, රාජ්‍ය පරිපාලන, මුදල් සහ වෙනත් අධිකාරීන් භාර අමාත්‍යාංශ විසින් ඒ අවස්ථාව වන විට නිශ්චිතව දක්වා ඇති විධිවිධාන යටතේ අනුයුක්ත කිරීමේ පදනම මත ඔහු / ඇය සේවයෙන් නිදහස් කර ගැනීම සඳහා ඔවුන්ගේ රේඛීය අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීමේ වගකීම ඔහු / ඇය විසින් දැරිය යුතුය. ඔවුන් තම අයදුම්පත් අදාළ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

අනුයුක්ත කිරීමේ කාලසීමාව ආරම්භයේ දී වසර එකක් (01) වන අතර, එම කාලසීමාව අලුත් කිරීම තනතුර දරන්නාගේ කාර්යසාධනය සහ වෙනත් ආයතනික අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

## අයදුම්පත් :

සුදුසුකම්ලත් අපේක්ෂකයින්ට, ඔවුන්ගේ ජීව දත්ත පත්‍රිකා (Curriculum Vitae), ඥාතීන් නොවන නිර්දේශකයින්ගේ නම් සහ සම්බන්ධ කරගැනීමේ තොරතුරු සමග 2025 නොවැම්බර් 17 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි "hr@dpa.gov.lk" යන විද්‍යුත් තැපැල හරහා යොමු කරන ලෙස ආරාධනා කරනු ලැබේ.

අයදුම්කරනු ලබන තනතුර විද්‍යුත් තැපැල් ලිපියේ ශීර්ෂය තීරුවේ සඳහන් කළ යුතුය.

කෙටි ලැයිස්තුගත කළ අපේක්ෂකයින් පමණක් සම්බන්ධ කරගන්නා බව කරුණාවෙන් සලකන්න.

ඔබගේ සහතිකවල පරිලෝකනය කරන ලද පිටපත් ඔබගේ ජීව දත්ත පත්‍රිකාවට අමුණා නොඑවිය යුතුය. ඔබගේ අයදුම්පත කෙටි ලැයිස්තුගත කළහොත් අධිකාරිය ඔබ හා සම්බන්ධ වනු ඇත.

සියලුම අයදුම්පත් දැඩි රහස්‍ය භාවයකින් සලකනු ලබන අතර, ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය,**
**1 වන මහල, 5 වන කොටස, BMICH,**
**බෞද්ධාලෝක මාවත, කොළඹ 7.**
**දුරකථන : + 94 (0) 112697241 වෙබ් අඩවිය : www.dpa.gov.lk**